# මිනිසා ඉගෙන ගන්නේ කෙසේ ද?

## (විධිමත්, අවිධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය ගැන කෙරෙන විග්‍රහයකි)

මිනිසා ඉගෙන ගන්නේ කෙසේ දැයි යන ප්‍රශ්නය නැගුවහොත් එයට විවිධ ආකාරයේ පිළිතුරු ලැබිය හැකි වේ. අප දන්නා අයුරින් පංචේන්ද්‍රියන්ම උපයෝගී කර ගනිමින් මිනිසා අධ්‍යාපනය නැතිනම් ඉගෙනුම කරනු ඇත. නමුත් අප මෙම ලිපිය මඟින් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වනනේ මෙම ඉගෙනීම්වල ස්වභාවය සහ විශේෂ ලක්ෂණයන් මොනවා ද යන්න ගැන ය.

මානව ඉගෙනීම එහි ස්වභාවය අනුව ප්‍රධාන වර්ග තුනකට බෙදිය හැකි වේ. එනම්, විධිමත් ඉගෙනුම, අවිධිමත් ඉගෙනුම සහ නොවිධිමත් ඉගෙනුම වශයෙනි. අධ්‍යාපනය ද මෙසේ තෙවැදෑරුම් අයුරින් වර්ග කෙරේ. එනම් විධිමත් අධ්‍යාපනය, අවිධිමත් අධ්‍යාපනය සහ නොවිධිමත් අධ්‍යාපනය වශයෙනි. විශේෂයෙන් ගත් කළ පාසල් ළමුන් ලබන අධ්‍යාපනය/ඉගෙනුම විධිමත් අධ්‍යාපනය ගණයට වැටෙන අතර වැඩිහිටියන් සඳහා කරනු ලබන පුහුණුවීම් ආදිය නොවිධිමත් අධ්‍යාපනය ගණයට වැටේ. මෙවැනි කිසිම සැලසුමක් නොමැතිව මිනිසා එදිනෙදා තම අත්දැකීම්වලින් ඉගෙන ගන්නා දෙය අවිධිමත් අධ්‍යාපනය ගණයට වැටෙනු ඇත. මෙම ලිපියේ අරමුණ වන්නේ විධිමත් අධ්‍යාපනය හෙවත් සාම්ප්‍රදායික අධ්‍යාපනය සහ අනෙකුත් ආකාරයේ අධ්‍යාපන ක්‍රමයන් අතර පවතින්නා වූ සමාන අසමානතාවයන් සහ වැදගත්කම් ගැන සොයා බැලීමයි.

**අධ්‍යාපනය**

මිනිසා මොලොවට බිහි වූ ද සිට මිය ඇදෙන දින දක්වා ම ඉගෙනුම් ක්‍රියාවලියේ යෙදෙන බව බොහෝ දෙනා අවිවාදයෙන් පිළිගන්නා කරුණකි. එහෙයින් අධ්‍යාපනය යන්න මුළු ජීවිත කාලය පුරාම අඛණ්ඩව ක්‍රියාත්මක වන්නා වූ නිමක් නැති ක්‍රියාවලියකි. අධ්‍යාපනය යන්නට විවිධ පුද්ගලයන් විසින් විවිධ අර්ථකථනයන් වරින් වර ලබා දී ඇති නමුත් මෙම ලිපියෙන් එම විග්‍රහයන් ඒ අයුරින් ම සඳහන් කිරීමක් සිදු නොවේ. එවැනි අදහස් සම්පිණ්ඩනය කරමින් අධ්‍යාපනය යන්නට ඉතාමත් සරල වූ විග්‍රහයක් 'එන්සයික්ලොපීඩියා බ්‍රිටැනිකා' නම් විශ්වකෝෂය මඟින් ලබා දී තිබේ. එහි සඳහන් වන්නේ සමාජයේ ඒකරාශී වී ඇති දැනුම සහ වටිනාකම් එක් පරපුරකින් තවත් පරපුරකට ගෙන යන්නා වූ මාධ්‍ය අධ්‍යාපනය යන්නයි. මෙම විශ්වකෝෂය අධ්‍යාපනය ගැන පවසන්නා වූ සරල අදහස තවදුරටත් විග්‍රහ කර බලන විට පෙනී යන්නේ අධ්‍යාපනය නොමැතිව සමාජයේ කිසිදු පරිණාමයක් සිදු විය නොහැකි බවයි.

යම් පුද්ගලයෙක් අවට ඇති භෞතික මෙන්ම සමාජ පරිසරය ද ඔහුගේ පාසල ලෙස සැලකිය හැකිය. එම පරිසරවල සිදුවන ක්‍රියාකාරකම් තුළින් ඔවුන් ඉගෙනීම ලබයි. සියළු දෙනාම මුළු ජීවිත කාලය පුරාවටම අඛණ්ඩව ඉගෙනුම් ක්‍රියාදමයක නිරත වන බැවින් ඔවුන් පරිසරය නැමති මෙම සිප්හලේ ගුරුවරුන් මෙන්ම ශිෂ්‍යයෝ ද වෙති. මෙයින් පෙනී යන්නේ සියළු දෙනාම අඛණ්ඩව පරිසරය නමැති සිප්හලේ අකුරු කරන්නන් වන අතර එයින් තම චින්තනයන් සහ ක්‍රියාකාරකම් වරින් වර වැඩි දියුණු කර ගන්නා බවයි.

ඒ අනුව, යම් මූලික සිද්ධාන්තයක් ගොඩනැංවීමට හැකියාව පවතී. එනම්, යම් පුද්ගලයෙකුගේ චර්යාවන් (හැසිරීම) තීරණය කරනු ලබන්නේ ඔහු හෝ ඇය සිය දිවිය පුරා ලද අත්දැකීම් සම්භාරය මත පදනම් වූ ඔහුගේ අධ්‍යාපනය විසින් බවයි. මේ අනුව පුද්ගලයෙකුගේ ඉගෙනුම පාසල් අධ්‍යාපනයට හෝ විධිමත් අධ්‍යාපනයට පමණක් සීමා නොවන බව ද, මුළු දිවිය පුරා ඔහු හෝ ඇය ලත් අත්දැකීම්, දැනුම, කුසලතා හා වර්ධනය කර ගත් ආකල්පයන් ද එයට ඇතුළත් වන බව ද පැහැදිළි වේ.

සෑම පුද්ගලයෙකුම ඉගෙනුම සඳහා පංචේන්ද්‍රියයන් උපයෝගී කර ගන්නා අතර එම ඉන්ද්‍රියයන් මඟින් ලබා ගන්නා සංවේදිතාවයන් එම පුද්ගලයා විසින් අවබෝධ කර ගනු ලබන්නේ ඔහු හෝ ඇයට හිමි වී ඇති බුද්ධි මට්ටම අනුව ය. එමනිසා, පුද්ගල ක්‍රියාකාරකම් නිරතුරුව රඳා පවතින්නේ ඔහු හෝ ඇය සතු යමක් අවබෝධ කර ගැනීමේ හැකියාව මතයි. සිය පංචේන්ද්‍රියයන්

තුළින් උකහා ගනු ලබන බාහිර තොරතුරු මඟින් යමෙක් තුළ යම් වෙනසක් ඇතිවීම දක්වා සිදු වන්නා වූ මුළු ක්‍රියාවලියම ඉගෙනුම ලෙස හැඳින්වීමට හැකිය. ඉගෙනුම මඟින් යම් පුද්ගලයෙකුගේ ක්‍රියාකාරකම් වල වෙනසක් ඇති වූව ද, ඇති නොවූව ද, එම පුද්ගලයා යම් කරුණක් පිළිබඳව අවබෝධයක් ලද නිසා එය ඉගෙනුමක් ලෙස සැලකිය හැකි වේ.

ඉගෙනුම මඟින් පුද්ගල ක්‍රියාකාරකම්වල යම් වෙනසක් ඇතිවීම බලාපොරොත්තු විය හැකි දෙයකි. එසේ වූවද, ඉගෙනුමෙන් පමණක් එම පුද්ගලයාගේ ක්‍රියාකාරකම්වල වෙනසක් ස්ථිර වශයෙන් ම සිදු වේ යැයි අපේක්ෂා කළ නො හැකිය. ඔහුගේ හෝ ඇයගේ ක්‍රියාකාරකම්වල වෙනසක් සිදු විය හැක්කේ ඔහු හෝ ඇය විසින් ලබාගත් ඉගෙනුමට ගැලපෙන්නා වූ ක්‍රියාකාරකම් ඉටු කළ හැකි පරිසරයක් ද බිහි වී තිබෙන අවස්ථාවක දීය. එසේ ඉගෙනුම යන්න පුද්ගලයාගෙන් පුද්ගලයාට විශේෂිත වන කරුණකි. එම සිදුවීමක් හෝ අත්දැකීමක් මඟින් පුද්ගලයින් දෙදෙනෙකු ලද ඉගෙනුම නිසා ඔවුන් දෙදෙනා තුළම සමාන ක්‍රියාකාරකම් ඇතිවීමක් සිදු නොවිය හැකිය.

**විධිමත් අධ්‍යාපනය**

විධිමත් අධ්‍යාපනයෙහි ඉතිහාසය ක්‍රි.පූ. 3000 පමණ කාලයක් ඈතට දිව යන්නකි. මේ පිළිබඳව මුල්ම තොරතුරු ලැබෙන්නේ මෙසපොතේමියාවෙනි. එකල, එම රටේ විසූ ජනතාව ආගමික විශ්වාසයන් ගැන දැනුවත් කිරීම සඳහා විධිමත් අධ්‍යාපනය යොදා ගත් බව තහවුරු වී තිබේ. ඉන් පසු මෙම අධ්‍යාපන ක්‍රමය ගැන තොරතුරක් ලැබෙන්නේ චීනයෙනි. ඔවුන් ක්‍රි.පූ. 1500 පමණ වන විට විධිමත් අධ්‍යාපනය භාවිතා කොට ඇත. ක්‍රි.පූ. පස්වන සියවස පමණ වන විට වඩාත් දියුණු වූ විශ්වවිද්‍යාල පද්ධතියක් ඉන්දියාවේ ක්‍රියාත්මක වී ඇති බවට හේතු සාධක සොයා ගෙන ඇත. අතීතයේ ජීවත් වූ ජනතාව ශිෂ්ට සම්පන්න පුද්ගලයන් බවට පත් කිරීමේ ලා ප්‍රධාන මාධ්‍ය වී ඇත්තේ මෙම විධිමත් අධ්‍යාපනය බවට කිසිම සැකයක් නැත. වර්තමානයේ ද, මෙම තත්ත්වය පවතින්නේ එම ආකාරයෙන් ම ය.

විධිමත් අධ්‍යාපනය යනු ක්‍රමවත් ව හා ව්‍යුහාත්මකව සැලසුම් කරන ලද වැඩසටහන් උපයෝගී කර ගනිමින් ලබා දෙන අධ්‍යාපනයයි. මෙයට හොඳම නිදසුන ලෙස ගත හැක්කේ වර්තමාන පාසල් අධ්‍යාපන ක්‍රමය සහ විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්‍රමයන් ය. විශේෂිත ව තෝරා ගත් ඉගෙනුම් ලබන කණ්ඩායමක් සිටීම විධිමත් අධ්‍යාපනයක මූලික ලක්ෂණයක් වේ. එසේම, විශේෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා සකස් කරන ලද විෂය නිර්දේශයන්, ව්‍යුහාත්මකව සැකසූ අධ්‍යාපනික ක්‍රමවේද, නිශ්චිත ව සකස් කරන ලද කාල රාමුවක් මෙන් ම මුලින් සකස් කරන ලද ඇගයුම් ශිල්පීය ක්‍රමයන් මෙම විධිමත් අධ්‍යාපන ක්‍රමයකට ආවේනිකව වූ අනෙකුත් විශේෂ ලක්ෂණයන් ය. ඉගෙනුම ලබන්නන් අදාළ ඉගෙනුම අවසන් වන විට ලබා ගත යුතු දැනුම, කුශලතා හා ආකල්ප පිළිබඳ ව පූර්ව දැනුමක් ලබා තිබීම මෙහි දී දැකිය හැකි අතර ඉගෙනුම ලබා දෙන්නන් ද ඒවා ගැන පූර්ව අත්දැකීමකින් යුතුව කටයුතු කරයි. විභාග ඇගයීම් ක්‍රම සහ පෙර සකස් කරන ලද ඉගෙනුම් ශිල්පීය ක්‍රම විධිමත් අධ්‍යාපනයක අත්‍යාවශ්‍ය අංගයන් ය. මෙහි දී, සැලකිලිමත් විය යුතු අනෙක් කරුණ වන්නේ යමෙකුට විධිමත් අධ්‍යාපනයට පිවිසීම අහම්බෙන් සිදු විය හැකි දෙයක් නො වීමයි. ඔහු මේ සඳහා යම් යම් කොන්දේසි සපුරා තිබිය යුතු වේ. උදහරණ වශයෙන් ගත් කළ පාසල් අධ්‍යාපනයට යොමුවීම සඳහා විශේෂයෙන් ම නිශ්චිත වයස සම්පූර්ණ කළ යුතු අතර විශ්වවිද්‍යාල අධ්‍යාපනයට ඇතුළත්වීම සඳහා එයට අවශ්‍ය කරන සියලු ම සුදුසුකම් සපුරාලිය යුතු වේ.

**අවිධිමත් අධ්‍යාපනය**

අධ්‍යාපනය පිළිබඳව පොදු පැහැදිලි කිරීම් දෙකක් ඇත. ඉන් පළමුවැන්න වන්නේ අධ්‍යාපනය යනු කෙනෙකුගේ මුළු දිවිය පුරාම අඛණ්ඩව සිදුවන ක්‍රියාවලියක් බවයි. දෙවන කරුණ වන්නේ මිනිසුන් ජීවත් වන භෞතික හා සමාජ පරිසරය ඔවුන්ට පාසලක් වන බවයි. මෙම කරුණු දෙකම ගොඩනැඟී ඇත්තේ විධිමත් අධ්‍යාපනය මුල් කර ගෙන නොව, අවිධිමත් අධ්‍යාපනය මුල් කර ගෙන ය. කෙනෙකුගේ විධිමත් අධ්‍යාපනය ආරම්භ කෙරෙන හා අවසන් කෙරෙන යම් යම් කාලසීමාවන් පැවතිය ද, ඔහු ලබන අවිධිමත් අධ්‍යාපනය එසේ නොවේ. කිසිදු විධිමත් අධ්‍යාපනයක් නොමැතිව වුව ද, මිනිසාට භෞතික හා සමාජ පරිසරයේ රැඳී සිටීමට අවශ්‍ය වන

පසුබිම (දැනුම, කුශලතා හා ආකල්ප) සකසා දෙනනේ මෙම අවිධිමත් අධ්‍යාපනය මඟිනි.

යමෙක් තම දිවිය පුරා නොදැනුවත්ව ම කෙරෙන ඉගෙනුම් ක්‍රියාවලිය සිදු වන්නේ විධිමත්ව සැකසූ කිසිම ක්‍රියාමාර්ගයකින් හෝ වැඩ පිළිවෙලකින් නොවේ. එය හුදෙක් තමා විසින් තම සමාජ හා භෞතික පරිසරය නිරීක්ෂණය කිරීම මඟින් ලබා ගන්නා දැනුම් සම්භාරයකි. වෙනත් අයුරකින් පවසන්නේ නම් මෙම අවධිමත් අධ්‍යාපනය යනු යමෙක් විසින් මෙහෙය වනු ලබන පෙර සැලසුම් කරන ලද ක්‍රියාවලියක් නොවේ. අවිධිමත් අධ්‍යාපනය මෙහෙයවනු ලබන පුද්ගලයෙක් ඇත්නම් ඒ අනිවාර්යයෙන්ම අවට ඇති භෞතිකමය සහ සමාජමය පරිසරයම පමණක් වේ. මේ නිසාම අරමුණු පිහිටුවීම, විෂය නිර්දේශයන් සැකසීම, ඇගයීම් ක්‍රමවේදයන්, කාලසටහන් වැනි දේ විධිමත් අධ්‍යාපනයේ දී දැකිය හැකි වුව ද, අවිධිමත් අධ්‍යාපනයේ දී දැකිය හැකි නොවේ. මේ අනුව අවිධිමත් අධ්‍යාපනය යන්න කිසියම් පුදගලයෙකු විසින් සැලසුම් නොකරන ලද, කිසිම කාර්යභාරයක් ඉටු නොකරන ලද, අපේක්ෂිත බලාපොරොත්තු නොතබන ලද, ඉගෙනුම් ක්‍රියාවලියකි. මෙහි දී, සැලකිල්ලට ගත යුතු වන විශේෂිත කරුණක් තිබේ. පරිසරය අපේ පාසල වුව ද, මිනිස් ක්‍රියාකාරකම් මත ස්වභාවික පරිසර ක්‍රියාකාරකම් වෙනස් වී, නව පාඩම් (විෂය නිර්දේශයන්) සකස් කර දීමට පරිසරය ද මැලි නොවන බවයි.

විධිමත් අධ්‍යාපනය ආරම්භ වීම සිදු වී ඇත්තේ අවිධිමත් අධ්‍යාපනය මුල් කර ගෙන බවට කිසිම සැකයක් නොමැත. පරිණාම ක්‍රියාවලියට සම්බන්ධ වී තිබුණු අවිධිමත් අධ්‍යාපනය තුළින් මිනිසා ලද දැනුම, තම ජීවන රටාවන් වෙනස් කර ගැනීමට ඔවුන්ට ඉවහල් විය. ගල් යුගයේ සිටි මිනිසා ඒඬේර යුගයට පිවිසීම අවිධිමත් අධ්‍යාපනය තුළින් මිනිසා ලද මහඟු ජයග්‍රහණයකි. කෙසේ වුව ද, මෙම යුග දෙකෙහිම විධිමත් අධ්‍යාපනයක් ගැන ඇසීමට නොලැබෙන අතර විධිමත් අධ්‍යාපනය ගැන තොරතුරු ලැබෙන්නේ ඉන් පසු මිනිසා සම්ප්‍රාප්ත වූ ගොවි යුගයේ සිට ය.

අවිධිමත් අධ්‍යාපනය තුළින් ස්වභාව ධර්මයා හා සමාජය සමඟ සහසම්බන්ධතාවයක් පවත්වා ගැනීමෙන් මිනිස් සංහතිය නොනැසී පවත්වා ගැනීමටත්, පරිසරයේ යම් යම් වෙනස්කම් ඇති කර ගැනීමටත් මිනිසා උත්සුක වූයේ ය. ගල් යුගයෙන් ඒඬේර යුගයටත්, ඒඬේර යුගයෙන් ගොවි යුගයටත් වර්තමානයේ ගෝලීයකරණ යුගය දක්වා ත්, මිනිසා විකාශනය වීමේ මූලික බීජය පිහිටා ඇත්තේ ඔහු ලද මෙම අවිධිමත් අධ්‍යාපනය තුළ ය.

විධිමත් අධ්‍යාපනයේ පියා, අවිධිමත් අධ්‍යාපනය වන්නේ යැයි පැවසුවහොත් එය නිවැරදි බව මට සිතේ. මන්ද? අවිධිමත් අධ්‍යාපනය තුළින් මිනිසා ලත් ඉගෙනුම උපයෝගී කර ගනිමින් ඔවුන් තම පරපුර සඳහා විධිමත් අධ්‍යාපන ක්‍රමයක අවශ්‍යතාවය හඳුනා ගැනීමටත් එවැන්නක් සැලසුම් කිරීමටත් පෙළඹී ඇති බැවිනි.

විශේෂයෙන් ම, මිනිසා ශිෂ්ඨ සම්පන්න වීමට පෙර විධිමත් අධ්‍යාපන ක්‍රමයක් පැවති බවට සාක්ෂි සොයා ගෙන නොමැත. සංක්‍රමිකව ජීවත් වූ ගෝත්‍රික කණ්ඩායම් අතර පවා එවැනි දෙයක් දක්නට නොලැබුණි. ස්ථාවර මිනිස් වාසස්ථාන ගොඩනැඟී මානව ශිෂ්ඨාචාර ආරම්භ වීමත් සමඟ විධිමත් අධ්‍යාපන ක්‍රමයක බීජයන් රෝපණය වී ඇති බවට ඉතිහාසය සාක්ෂි දරනු ඇත. මෙයට ප්‍රබලම සාක්ෂිය වන්නේ, ඉතිහාසගත තොරතුරු අනුව ලොව ප්‍රථම වශයෙන් බිහි වූ බවට පිළිගන්නා මානව ශිෂ්ඨාචාරය වන මෙසපොතේමියානු ශිෂ්ඨාචාරයට පෙර විධිමත් අධ්‍යාපන ක්‍රමයක් පැවති බවට තොරතුරු සොයා ගත නොහැකි වීමයි. කෙසේ වුව ද, අවිධිමත් අධ්‍යාපනයෙන් මිනිස් පරපුර ලද දැනුම, කුසලතා හා ඇගයුම් තම පරපුරින් තවත් පරපුරකට ලබා දීමට ගනු ලැබූ අඛණ්ඩ උත්සාහයේ පිවිතුරු ප්‍රතිඵලයක් ලෙස විධිමත් අධ්‍යාපනය ලොවට බිහි වී තිබේ.

අවිධිමත් අධ්‍යාපනය යනු කුමක්දැයි පැහැදිලි කිරීම සඳහා එක් උදහරණයක් පමණක් සටහන් කිරීම ප්‍රමාණවත් යැයි මට සිතේ. ශ්‍රීමත් අයිසැක් නිවුටන් මහතා විසින් සොයා ගන්නා ලද ගුරුත්වාකර්ෂණ නියමය ගැන මෙය කියවන ඔබ දන්නවා ඇතැ යි සිතමි. ඔහු එය සොයා ගත් අයුරු ද පාඨක ඔබට මතක ඇත. එනම්, ශ්‍රීමත් අයිසැක් නිවුටන් ගුරුත්වාකර්ෂණ නියමය ලොවට හඳුන්වා දුන්නේ ඇපල් ගසකින් ගෙඩියක් බිමට වැටෙනවා දැකීමෙනි.

මා දයාබර පාඨකයිනි, ගුරුත්වාකර්ෂණ නියමය පිළිබඳ විධිමත් අධ්‍යාපනයක් තුළින් ශ්‍රීමත්

අයිසැක් නිව්ටන් මහතාට ඉගැන් වූ කෙනෙක් සිටි ද? එසේම, ඔහුට එවැනි දෙයක් ඉගෙනීම පිළිබඳව හෝ අදහසක් තිබුණේ ද, ගුරුත්වාකර්ෂණය පිළිබඳ ස්වභාවික නීතියක් ඔහු ඊට පෙර දන සිටියේ ද නැත. එම ගුරුත්වාකර්ෂණ නියමය ඉගෙන ගැනීම පිණිස ඔහු ඇපල් ගසක් යටට වී සිටියේ ද නැත. එසේම, ඇපල් ගස්වලින් මීට පෙර ද ඇපල් ගෙඩි බිමට වැටෙන්නට ද ඇත. ශ්‍රීමත් අයිසැක් නිව්ටන් මහතා ට පෙර ද, මෙම ඇපල් බිමට වැටෙන අයුරු වෙනත් පුද්ගලයින් විසින් ද දක ඇත. මෙවැනි පසුබිමක් තුළ වුව ද, ඇපල් ගසකින් ඇපල් ගෙඩියක් බිමට වැටෙන අයුරු නිරීක්ෂණය කර ගුරුත්වාකර්ෂණ නියමය ඉගෙනීමටත්, එය ලොවට හඳුන්වා දීමටත් ශ්‍රීමත් අයිසැක් නිව්ටන් මහතා ට හැකි විය.

ශ්‍රීමත් අයිසැක් නිව්ටන් මහතාට මෙම ගුරුත්වාකර්ෂණ බලය ගැන කියා දුන්නේ විධිමත් අධ්‍යාපන ක්‍රමයක් මඟින් නම් නොවේ. මන්ද? ඒ වන විටත්, එවැනි නියමයක් ගැන කිසිවෙකු දන නොසිටි නිසා ය. මේ පිළිබඳ ඔහුට කියා දුන්නේ ස්වභාව ධර්මයා මඟින් ලබා දෙන අවිධිමත් අධ්‍යාපනය මඟින් බවට කිසිම සැකයක් නැත. එතුමාට පෙර පවා ස්වභාව ධර්මයා මෙම පාඩම තවත් අයට ද කියා දී තිබේ. ඔවුන්ට එම පාඩම අර්ථ නිරූපණය කර ගැනීමට හැකියාවක් තිබී නොමැත. මෙමඟින් පැහැදිලි වන එකම කරුණ වන්නේ පුද්ගලයාට ආවේණික වූ බුද්ධි මට්ටම ඔහු හෝ ඇය ලබන ඉගෙනුමෙහි ප්‍රමාණය කෙරෙහි බලපාන බවත්, එකම පාඩම එකම අයුරකින් කියා දුන්න ද, එමඟින් ලබා ගත හැකි ඉගෙනුම පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් විය හැකි බවත් ය.

භෞතිකමය සහ සමාජීය පරිසර ක්‍රියාකාරීත්වයන් නිරීක්ෂණය කරමින් ගුරුත්වාකර්ෂණ බලය ඉගෙන ගන්නා කෙනෙක් මේ වන විට නොමැත. ශ්‍රීමත් අයිසැක් නිව්ටන් මහතා හැර අවිධිමත් අධ්‍යාපනයෙන් ගුරුත්වාකර්ෂණ බලය ඉගෙන ගත් හෝ ඉගෙන ගන්නා කිසිවෙකුත් නොමැත. අවධිමත් අධ්‍යාපනය මඟින් නිව්ටන් ඉගෙන ගත් මෙම නියමය මතු පරපුරට ලබා දී ඇත්තේ විධිමත් අධ්‍යාපනය මඟිනි. විධිමත් අධ්‍යාපනයේ නිර්මාතෘ වන්නේ අවිධිමත් අධ්‍යාපනය යැයි මා මීට පෙර සඳහන් කර ඇත්තේ මේ නිසා ය.

## නොවිධිමත් අධ්‍යාපනය

'කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සහ භාවිතය' අද ශ්‍රී ලාංකිකයින් වැඩි දෙනෙකුගේ ප්‍රධාන මාතෘකාවක් බවට පත් වී ඇත. එම නිසා, මේ ගැන ඉගෙනීමට ගොවිතැන් කරන්නෙකු වශයෙන් මට අවශ්‍යතාවයක් පැන නැඟී ඇත. මම මේ පිළිබඳව පළාත් කෘෂිකර්ම උපදේශකවරයෙකු සමඟ සාකච්ඡා කළෙමි. ඔහු අපේ ගමට පැමිණ මා හා අපේ ගමේ එම අවශ්‍යතාවය තිබූ තවත් කිහිප දෙනෙකු කැඳවා ගෙන කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිළිබඳව න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික පුහුණුවක් ද ලබා දෙන ලදී. මෙය මා ලද ඉගෙනුමකි. ඔබ අදහස් කරන්නේ මෙය මා විධිමත් අධ්‍යාපනයකින් ලත් ඉගෙනුමක් ලෙස ද, එසේත් නැත්නම් අවිධිමත් අධ්‍යාපනයකින් ලත් ඉගෙනුමක් ලෙස ද? මේ දෙකෙන්, එකකට හෝ ඔබ ඔව් යැයි පිළිතුරු දේ නම් ඔබ නිවැරදි නැත. මෙය මා ඉගෙන ගත්තේ නොවිධිමත් අධ්‍යාපනය තුළිනි.

නොවිධිමත් අධ්‍යාපනය යනු විධිමත් හා අවිධිමත් අධ්‍යාපනය අතර තුර පවත්නා අධ්‍යාපන ක්‍රමයකි. විධිමත් අධ්‍යාපනයත්, නොවිධිමත් අධ්‍යාපනයත් අතර ඇති වෙනස්කම් පැහැදිලිව හඳුනා ගැනීමට අපහට හැකිය. එසේ වුවත් අවිධිමත් සහ නොවිධිමත් අධ්‍යාපන ක්‍රමයන් හි ඇති වෙනස එකවරම වටහා ගැනීමට අපහසු ය.

මෙයට එක් හේතුවක් වන්නේ බොහෝ විශ්ව කෝෂවල අවිධිමත් අධ්‍යාපනය සහ නොවිධිමත් අධ්‍යාපනය සඳහා කර ඇති අර්ථකථනයන් බොහෝ දුරට සමාන වීම ය. එසේ වුව ද, මෙම අධ්‍යාපන ක්‍රමයන් හි දකිය හැකි යම් යම් ව්‍යුහයන් ගැන විශේෂ අවධානයක් යොමු කිරීමෙන් අවිධිමත් හා නොවිධිමත් අධ්‍යාපන ක්‍රමයන් හි ඇති වෙනස්කම් හඳුනා ගැනීමට හැකි වේ.

නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන්, විධිමත් අධ්‍යාපන වැඩසටහන් මෙන්ම සම්පූර්ණයෙන් ව්‍යුහගත ඒවා නොවේ. එසේ වුවද, යම් මට්ටමක ව්‍යුහගත කිරීමක් නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන්වල ඇත. එසේම අධ්‍යාපනවේදීන් විසින් දඩි පරීක්ෂාවට ලක් කර සකස් කරනු ලැබුවා වූ විෂය නිර්දේශයක් නොවුව ද යම්

අයුරකින් සකස් කළ විෂය නිර්දේශයක් නොවිධිමත් අධ්‍යාපන ක්‍රමයක් තුළ ඇත. එසේම, දැඩි කාල රාමුවකට යටත් නොවූන ද, යම් මට්ටමකට සැකසූ කාල රාමුවක් මෙන්ම දැඩි ලෙස සැලසුම් කළ ඇගයුම් උපකරණ නො වූව ද යම් මට්ටමකට සැකසූ අගයුම් උපකරණ ද නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් තුළ දැකිය හැකිය.

කෙසේ වූව ද, විධිමත් හා නොවිධිමත් අධ්‍යාපන ක්‍රම වෙන් කර හඳුනා ගත හැකි පහසුම ක්‍රමය වන්නේ එම අධ්‍යාපන ක්‍රම දෙකෙහි පවතින විධිමත් භාවයේ ප්‍රමාණයයි. එනම්, නොවිධිමත් අධ්‍යාපනය, අධ්‍යාපනය ලබන්නාට මෙන්ම ලබා දෙන්නාට ද දැඩි ලෙස ලිහිල් බවක් පෙන්වන අධ්‍යාපන ක්‍රමයක් වන අතර විධිමත් අධ්‍යාපනය නොවිධිමත් අධ්‍යාපනයට සංසන්ද-නාත්මකව දැඩි රාමුවක් තුළ බැඳ දමා ඇති එකකි. විධිමත් අධ්‍යාපනයේ මෙන් සම්ප්‍රදායික අධ්‍යාපනික ක්‍රියාමාර්ගයන් හා ශිල්ප ක්‍රමවල න්‍යායික කරුණු නොවිධිමත් අධ්‍යාපනයේ දී බොහෝ විට භාවිතා කරනු නොලැබේ. එසේම, සකස් කරන ලද පංති කාමර, කලින් සකස් කළ විෂය මාලාවන්, අධ්‍යාපන සැසි හා විභාග නොවිධිමත් අධ්‍යාපනයේ දී භාවිතා කෙරෙන්නේ ඉතාමත් කලාතුරකිනි.

නොවිධිමත් අධ්‍යාපන ක්‍රමයේ පවතින ඉහත කී ලක්ෂණයන් නිසා වර්තමානය වන විට වැඩිහිටියන් සඳහා ඉගැන්වීමට වඩාත් සුදුසු වන්නේ නොවිධිමත් අධ්‍යාපන ක්‍රමය බව හඳුනා ගෙන ඇත. වර්තමානයේ බොහෝ රටවල කෘෂිකර්මය, කර්මාන්ත සහ කළමනාකරණය යන විවිධ වැඩිහිටි සුභසාධක වැඩපිළිවෙලවල් අඩංගු ව්‍යාපෘති කටයුතුවල දී බහුල ලෙස නොවිධිමත් අධ්‍යාපනය යොදා ගෙන ඇත්තේ එහෙයිනි.

විධිමත්, අවිධිමත් හා නොවිධිමත් අධ්‍යාපන ක්‍රමයන් හි ඇති වෙනස්කම් හඳුනා ගැනීමට අපි ඉතාමත් සරල උදාහරණයක් මගින් උත්සාහ ගනිමු. මා සිතන්නේ මේ සඳහා මා ඉහතින් සඳහන් කරන ලද උදාහරණයම වඩාත් සුදුසු වන බවයි. එනම්, කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිළිබඳව මා ලද නොවිධිමත් අධ්‍යාපනයයි.

කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය ගැන විධිමත් අධ්‍යාපනය තුළින් අවබෝධයක් ලබා දිය නොහැකිද? පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කෘෂිකර්ම විෂය ක්ෂේත්‍රයට කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරන්නේ කෙසේද යන්න ඇතුළත් කර පාසල් පංති කාමරයක් තුළ දී හෝ පාසල් භූමිය හෝ වෙනත් තෝරාගත් භූමියක් තුළදී, මේ පිළිබඳව න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික අත්දැකීමක් සිසුන් වෙත ලබා දිය හැකිය. එය විධිමත් අධ්‍යාපනයකි. මෙහි දී, මෙම අධ්‍යාපන ක්‍රමය සකස් කර ඇත්තේ කිසිම ප්‍රශ්නයකට හෝ ගැටළුවකට විසඳුමක් වශයෙන් නොවේ. පාසලේ නවය වසරේ දී හෝ දහය වසරේ දී කෘෂිකර්ම විෂය නිර්දේශය සඳහා ඉගෙන ගත් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිළිබඳව ප්‍රායෝගිකව අත්හදා බලනු ලබන්නේ පංතියේ සිටි කීයෙන් කී දෙනා ද?

මා හට කොම්පෝස්ට් පොහොර නිපදවා ගැනීම ගැන උවමනාවක් තිබුණි. කුමක් නිසාද යත්, මා ගෙවත්තේ එළවළු මෙන්ම පලතුරු පැල කිහිපයක් වගා කර ඇති බැවිනි. එමනිසා මට කොම්පෝස්ට් පොහොර නිපදවන ආකාරය ගැන දැන ගැනීමට අවශ්‍යතාවයක් තිබුණ ද, මා එය දැන ගන්නේ කෙසේ ද යන්න පිළිබඳව ගැටළුවක් තිබුණි.

මෙවැනි මානසික තත්ත්වයකින් සිටින මම නිවස බලා යෑමට බස් රථයකට ගොඩ වූනෙමි. බස් රථයේ මට අසුනක් ලැබුනේ නැත. එම නිසා, මම සිටගෙන බස් රථයේ ගමන් කලෙමි. මා අසල ආසනයේ වාඩි වී සිටියේ නොහඳුනන මිනිසුන් දෙදෙනෙකි. ඔවුන් කථා කරමින් සිටියේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරන අයුරුයි. ඔවුන් දෙදෙනා මිතුරන් විය හැකිය. ඉන් කෙනෙක්, අනෙකාට කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරන ආකාරය ගැන මැනවින් පැහැදිලි කර දෙනු ලැබීය. ඔවුන්ගේ එම සාකච්ඡාව අවසන් වූව ද, ඔවුන් බසයෙන් බැසීමට පෙර මට බස් රථයෙන් බැසීමට සිදු විය. එසේ වූව ද, මා බස් රථයෙන් බිමට බසිනු ලැබුවේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිළිබඳ ඉගෙනුමක් සමඟ ය. මා හට කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිළිබඳව අවශ්‍යතාවයක් පැවති බැවිනුත්, ඒ සඳහා මා තුළ ගොඩනැගී පැවති බුද්ධිය විවර වී තිබුණු නිසාත්, මම ඒ පිළිබඳව නොසිතු-නොපැතු ආකාරයෙන් ඉගෙනීමක් ලද්දෙමි. මෙය අවධිමත් අධ්‍යාපනය තුළින් මා ලත් ඉගෙනුමකි.

කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිළිබඳ දැනීම නොවිධිමත් අධ්‍යාපනය තුළින් ද ලබා ගත හැකි අවස්ථාවක් සඳහන් කරනු කැමැත්තෙමි. ඒ මා මීට පෙර සඳහන් කරන ලද උදාහරණයම ය. මාගේ අවශ්‍යතාවය මත මෙන්ම මා හා සමාන අවශ්‍යතාවයක් ඇති පිරිස් වෙතට පැමිණෙන ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකතුමා අපහට කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිළිබඳව න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික අත්දැකීමක් ද ලබා දෙනු ලැබේ. මෙය විධිමත් හෝ අවිධිමත් නොව, නොවිධිමත් අධ්‍යාපනය තුළින් මා ඒ පිළිබඳව ගෙන ගත් අවස්ථාවකි.

එකම ඉගෙනුමක් විධිමත්, අවිධිමත් මෙන්ම නොවිධිමත් අධ්‍යාපනය තුළින් ද ලද හැකි වන්නේ ය. එහි විශේෂත්වය වන්නේ අධ්‍යාපනය ලබන පුද්ගලයන් කවරහු ද, ඔවුන්ගේ බුද්ධි මට්ටම කුමක් ද, දැනට ඔවුන් තුළ එම බුද්ධි මට්ටම අනුව ගොඩනැඟී ඇති දැනුම, කුසලතා හා ආකල්ප කවරේ ද? ඔවුන්ගේ වයස මට්ටම කවරේ ද? යන්න මෙන්ම ඔවුන්ගේ වර්තමාන සමාජ තත්ත්වය කවරේ ද? යන්න ඉගෙනුම් ක්‍රමය තෝරා ගැනීමේ දී සැලකිල්ලට භාජනය කළ යුතු වීමයි. එසේ සැලකිලිමත් වීම තුළින් ඉගෙන ගන්නාගේ ඉගෙනුම් ප්‍රමාණය වඩාත් වර්ධනය කළ හැකිය.

මේ ලිපිය තුළින් ඔබ වැරදි අර්ථකථනයක් ලබා ගැනීමට උත්සාහ කළ හැකිය. ලිපියේ කතුවරයා වශයෙන් මා එය නිවැරදි කළ යුතුව ඇත. එය කුමක් ද යත් වැඩිහිටියන් හට ඉගැන්වීමට හැකි වන්නේ නොවිධිමත් අධ්‍යාපනය තුළින් පමණක් බවයි. එය එසේ නොවේ. වැඩිහිටියන්ට වඩාත් යෝග්‍ය අධ්‍යාපන ක්‍රමය ලෙස මා සිතන්නේ නොවිධිමත් අධ්‍යාපන ක්‍රමයයි. ඒ මෙතෙක් දශක දෙකකට අධික කාලයක් පුහුණු කරුවෙකු වශයෙන් වැඩිහිටියන් පුහුණු කිරීමේ දී මා ලත් අත්දැකීම් සැලකිල්ලට ගැනීමෙනි. කෙසේ වෙතත් මා නිවැරදි යැයි කිසිවිටකත් නොකියමි. මේ ගැන තවදුරටත් සමීක්ෂණ මෙන්ම තර්ක විතර්ක කළ යුතුව ඇත.

කෙසේ වුව ද, ළමුන්ට මෙන්ම වැඩිහිටියන්ට ද විධිමත් අධ්‍යාපන ක්‍රමය මඟින් ද ඉගෙන ගැනීමේ හැකියාව ඇත. එමෙන්ම, දැඩි කාල රාමු, විභාග, අභ්‍යාස සහ වෙනත් ව්‍යුහගත අධ්‍යාපනික සැලසුම් අනුගමනය කිරීම පිණිස වැඩිහිටියන් ද යොමු කළ හැකිය. එසේ වුව ද, ගැටළුව වන්නේ වැඩිහිටියන් ලෙස හඳුන්වනු ලබන පිරිස වැඩිහිටි ලක්ෂණ නිරන්තරයෙන් පෙන්නුම් කරනු ලබන අතර විධිමත් අධ්‍යාපන ක්‍රමය ඒවා සමඟ ගැටීමක් ඇතිවීමයි. එමඟින් අධ්‍යාපනය ලබා දෙන්නාට මෙන්ම අධ්‍යාපනය ලබන්නාට ද පීඩාවක් ඇති වන අතර අවසාන ප්‍රතිඵලය වන්නේ බලාපොරොත්තු වූ සිදුවීම ඉටු නොවීමයි.

මෙම ලිපියේ අරමුණ වූයේ විධිමත්, අවිධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය යනු කවරේ දැයි යන්න පිළිබඳව යම් තරමකින් පැහැදිලි කිරීමත්, ඒවා අතර ඇති යම් යම් වෙනස්කම් මොනවාද යන්න පාඨකයා හට අවබෝධයක් ලබාදීමත් ය. සියල්ලටම වඩා වැදගත් වන්නේ අධ්‍යාපනය සැලසුම් කරන්නන් විසින් එය ලබාදිය යුත්තේ විධිමත් අධ්‍යාපන ක්‍රමයක් මඟින් ද එසේත් නැත්නම් අවිධිමත් අධ්‍යාපන ක්‍රමයක් මඟින් ද එසේ නොමැති නම් නොවිධිමත් අධ්‍යාපන ක්‍රමයක් තුළින් ද යන්න පළමුව සිතා බැලීමයි.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. අයි. රණසිංහ පෙරේරා - 1992, පුහුණු ක්‍රමවේදය
2. අයි. රණසිංහ පෙරේරා - 2005 ජූනි, වැඩිහිටි පුහුණු ක්‍රමවේදය පිළිබඳ පුහුණු වැඩසටහන අත් පත්‍රිකා අංක 2
3. Etlling Arlen, - What is Non-formal Education? (අන්තර්ජාලය ඇසුරෙනි.)
4. Smith, Mark. K., 1996, Non-formal Education (අන්තර්ජාලය ඇසුරෙනි.)
5. Roger, Alan - 2004 Looking again at Non-formal and Informal Education - towords a new paradigm (අන්තර්ජාලය ඇසුරෙනි.)



**බණ්ඩාර රත්නායක**

**හිටපු සහාය අධි පර්යේෂක/ප්‍රධාන**
**මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**


**(මෙම සඟරාවේ සංස්කාරකවරයකු ලෙස කටයුතු කළ බණ්ඩාර රත්නායක මහතා හදිසියේ වියෝ වූ අතර, මෙම ලිපිය ඔහු වියෝවීමට කලින් ගොවි ජනතා වෙනුවෙන් සකස් කරන ලද්දකි. මෙහි දී ගොවි ජනතා වෙනුවෙන් ඒ මහතා විශේෂයෙන් සිහිපත් කෙරේ.)**